ඇමුණුම (01) (8)

99/06

දුරකථන Telephone Nos.
864807
869325
Fax : 869326
864812
865141-50

මගේ අංකය
ඔබේ අංකය
My No. } 4/මුදල්/6/95/ 54

අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர் கல்வி அமைச்சு
Ministry of Education and Higher Education

'ඉසුරුපාය' ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ
බත්තරමුල්ල.
'இசுருபாய' ஸ்ரீ ஜயவர்தனபுர கோட்டே
பத்தரமுல்ல
'ISURUPAYA' SRI JAYAWARDHANAPURA KOTTE
BATTARAMULLA

දිනය
திகதி
Date } 1998.12. 23

අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ අංක :- 1999/06.

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරු,
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරු හා
විදුහල්පතිවරු වෙත,

## ගුරු සෙත විශේෂ ගිණුම් ක්‍රමය - දෙන ලද ණය මුදල් ආපසු අය කර ගැනීම

හිටපු අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගේ යෝජනාවක් අනුව, 'ගුරුසෙත' නමින් විශේෂ ගිණුම් ක්‍රමයක් ආරම්භ කරමින් මා විසින් ඔබ වෙත එවන ලද මෙම අමාත්‍යාංශයේ අංක 1995/17 හා 95.06.30 දාතම චක්‍රලේඛය වෙත ඔබගේ අවධානය මෙයින් යොමු කරවමි.

02. එකී චක්‍රලේඛය අනුව මහජන බැංකුව සම්බන්ධ කර ගනිමින් ආරම්භ කරන ලද 'ගුරු සෙත' විශේෂ ගිණුම් ක්‍රමය යටතේ, ණය මුදල් ලබා ගත්තා වූද, ගුරු භවතුන් අතරින්, විශේෂයෙන්ම ස්ථාන මාරුවී ගිය ගුරු භවතුන්ගෙන් අදාළ ගිණ ණය වාරික මුදල් මහජන බැංකුව වෙත නිසි පරිදි අය නොවන බවට පැමිණිලි ලැබී ඇත. මෙම ගිණුම් ක්‍රමය අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හා මහජන බැංකුව එළඹි සාමූහික එකඟතාවයක් මත ක්‍රියාත්මක වන්නක් බැවින්, රජයට අය විය යුතු වෙනත් වර්ගවල ණය වාරිකයන් අය කර ගැනීමේ ක්‍රියා මාර්ගය ද මෙහිලා ක්‍රියාත්මක විය යුතු බව අවධාරණය කරමි. ඒ අනුව ස්ථාන මාරුවී යන ගුරු භවතුන්ගෙන් 'ගුරු සෙත' ණය වාරික අය කර ගැනීම සම්බන්ධයෙන් පහත දැක්වෙන ක්‍රියා මාර්ග අනුගමනය කරන ලෙස කාරුණිකව දන්වමි.

I. ස්ථාන මාරුවී යන ගුරුවරයෙකු/ගුරුවරියක 'ගුරුසෙත' ගිණුම් ක්‍රමය යටතේ ණය මුදල් ලබා ගෙන ඇත්තේ නම් ඒ බව ද ගුරු සෙත ණය මුදල් ලබා ගත් මහජන බැංකු ශාඛාවද, අදාළ විදුහලේ විදුහල්පති විසින් නව සේවා ස්ථානයේ විදුහල්පති වෙත දැනුම් දිය යුතුය. මෙම දැනුම් දීම, බලධර පැවරීමක් වශයෙන් සලකා ස්ථාන මාරුවී පැමිණි ගුරු භවතාගේ මාසික වැටුප් 'ගුරු සෙත' ගිණුමට (අදාළ විදුහලේ) බැර කිරීමට නව සේවා ස්ථානයේ විදුහල්පති ක්‍රියා කළ යුතුය.

II. තව ද අදාළ ගුරු භවතා ස්ථාන මාරුවී යන විදුහල සහ එකී විදුහල අයත් කලාප අධ්‍යාපන කාර්යාලය ද, අදාළ ගුරු භවතා සේවය කරමින් සිටි විදුහලේ විදුහල්පති විසින්, එකී ගුරු භවතා 'ගුරු සෙත' ණය මුදල් ලබා ගෙන ඇති මහජන බැංකු ශාඛාවට දැනුම් දිය යුතුය.

/...2